## විශේෂාංග සටහන

## ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද හෝ ඊට අදාළ ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග[1]

### මුදල් ප්‍රතිපත්තිය

| | |
|---|---|
| 2025 මැයි 22 | එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය පදනම් අංක 25කින් 8.00% සිට 7.75%ක් දක්වා අඩු කරන ලදී. ඊට සමගාමීව නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක ±50ක ආන්තිකයක් සමඟ එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සමඟ සම්බන්ධ කරමින් පිළිවෙළින් 7.25% සහ 8.25%ක් ලෙස පවත්වා ගන්නා ලදී. |

### ගෙවීම් හා පියවීම්

| | |
|---|---|
| 2025 ජනවාරි 27 | ඩිජිටල් ගනුදෙනු භාවිතය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, ඩිජිටල් ගෙවීම් ලබාගැනීමට හැකි තොරතුරු තාක්ෂණ පද්ධතියක් නොමැති රාජ්‍ය ආයතන වෙත ඩිජිටල් ගෙවීම් පිළිගැනීම පහසු කිරීමට හඳුන්වාදුන් ගෙවීම් වේදිකාව වන GovPay හරහා සිදු කරනු ලබන එක් ගනුදෙනුවක් සඳහා අයකළ හැකි උපරිම ගාස්තුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2025 පෙබරවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රුපියල් 15/-ක් ලෙස නියම කරන ලදී. |
| 2025 පෙබරවාරි 07 | විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වන පොදු යාන්ත්‍රණයේ (CEFTS) සාමාජිකයින් අන්තර්ජාල බැංකුකරණ, ජංගම දුරකථන පදනම් කරගත් බැංකුකරණ සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර භාවිතයෙන් සිදු කෙරෙන ගනුදෙනුවක් සඳහා අයකළ හැකි උපරිම ගාස්තුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2025 පෙබරවාරි 15 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රුපියල් 25/-ක් ලෙස නියම කරන ලදී. තවද, 2025 පෙබරවාරි 15 වන දින සිට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව වැනි ගෙවීම් ක්‍රියාවලිය තත්කාලීනව සිදු කිරීමට සහ පාරිභෝගික ගිණුම් යාවත්කාලීන කිරීමට හැකියාව ලබාදෙන තොරතුරු තාක්ෂණ පද්ධති සහිත ආයතනවලට ගෙවීම් සිදු කිරීම සඳහා පහසුකම් සපයන ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව (LPOPP) හරහා සිදු කරනු ලබන ගනුදෙනුවක් සඳහා අය කරනු ලබන උපරිම ගාස්තුව එක් ගනුදෙනුවක් සඳහා රුපියල් 25/- නොඉක්මවිය යුතු බව ද තීරණය කරන ලදී. |
| 2025 පෙබරවාරි 20 | LANKAQR භාවිත කරන වෙළෙඳුන්ට AliPay+ පහසුකම සහිත යෙදවුම් භාවිත කරමින් සංචාරකයින් විසින් සිදු කරනු ලබන LANKAQR ගනුදෙනු පිළිගැනීම සඳහා AliPay Singapore E-commerce Private Limited සමඟ සම්බන්ධ වීමට ලංකාපේ පුද්ගලික සමාගම හට අනුමැතිය ලබා දෙන ලදී. |
| 2025 ජූනි 11 | ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතියේ (SLIPS) ප්‍රාථමික සහභාගිවන්නන්ගේ ගනුදෙනුකරුවන් විසින් සිදු කරන මුදල් පැවරීම් වලදී එක් ගනුදෙනුවක් සඳහා උපරිම වටිනාකම, 2025 ජූනි 25 වන දින සිට බලපැවැත්වෙන පරිදි රුපියල් මිලියන 5 සිට රුපියල් මිලියන 10 දක්වා වැඩි කරන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ගිණුම් පවත්වාගෙන යනු ලබන රජයේ ආයතනවලට ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය හරහා එවැනි ගිණුම් භාවිතයෙන් සිදු කරන ගනුදෙනුවල දී ගනුදෙනුවක උපරිම වටිනාකම රුපියල් මිලියන 50ක් දක්වා වන පරිදි සිදු කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. |
| 2025 දෙසැම්බර් 23 | 2024 දී නිකුත් කරන ලද මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා වන නියෝග 2025 දෙසැම්බර් 31 දින සිට බලපැවැත්වෙන පරිදි 2025 අංක 01 දරන මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා වන නියෝග සඳහා සංශෝධන නිකුත් කරන ලදී. එම මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා වන නියෝග යටතේ, මුදල් පැවරීම් සේවාවල නිරත විදේශීය සපයන්නන් මෙම නියෝගයන්හි නියාමන සහ අධීක්ෂණ රාමුව යටතේ ලියාපදිංචි විය යුතුය. |

### මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම

| | |
|---|---|
| 2025 පෙබරවාරි 27 | වැඩිදුර විමර්ශන සඳහා අවශ්‍ය තොරතුරු විදේශීය මූල්‍ය බුද්ධි ඒකක මගින් ලබා ගැනීමට කරනු ලබන ඉල්ලීම් සම්බන්ධ 2025 අංක 01 දරන මාර්ගෝපදේශය නිකුත් කරන ලදී. |

1. 2025 ජනවාරි 01 සිට 2026 මාර්තු 25 දක්වා කාලය තුළ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ඇතුළත් වේ.

2025 ජනවාරි 01 සිට 2026 මාර්තු 27 දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද හෝ එයට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ එම කාලය තුලදී ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල සවිස්තරාත්මක අනුවාදයක් මාර්ගගතව ලබා ගත හැක.

යොමුව : ප්‍රධාන මෙනුව → ප්‍රකාශන → ආර්ථික සහ මූල්‍ය වාර්තා → වාර්ෂික ආර්ථික විවරණය → වාර්ෂික ආර්ථික විවරණය 2025 → ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද හෝ ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ ප්‍රධාන ආර්ථී ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග

සබැඳිය : https://www.cbsl.gov.lk/si/ප්‍රකාශන/ආර්ථික-හා-මූල්‍ය-වාර්තා/වාර්ෂික-ආර්ථික-විවරණය/වාර්ෂික-ආර්ථික-විවරණය-2025/ප්‍රධාන-ආර්ථික-ප්‍රතිපත්තිමය-ක්‍රියාමාර්ග

| | |
|---|---|
| 2025 මාර්තු 20 | 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 15(1)(අ) සහ 15(2) වගන්ති යටතේ තොරතුරු ඉල්ලීම සම්බන්ධ 2025 අංක 02 දරන මාර්ගෝපදේශය නිකුත් කරන ලදී. |
| | 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ වැඩිදුර විමර්ශන සඳහා අවශ්‍ය සහය ලබා ගැනීමට කරනු ලබන ඉල්ලීම් සම්බන්ධ 2025 අංක 03 දරන මාර්ගෝපදේශය නිකුත් කරන ලදී. |
| 2025 අප්‍රේල් 04 | 2016 අංක 1 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති යටතේ රාජ්‍ය නොවන සංවිධාන, ලාභ නොලබන සංවිධාන හෝ පුණ්‍ය ආයතන සම්බන්ධයෙන් ප්‍රවර්ධිත නිසි උද්යෝගය අනුගමනය කිරීම පිළිබඳ 2025 අංක 01 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2025 සැප්තැම්බර් 03 | තුරඟ තරඟ මත ඔට්ටු ඇල්ලීමේ ආඥා පනත, සූදු ආඥා පනත සහ 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත ඉවත් කරමින් 2025 අංක 17 දරන සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත ව්‍යවස්ථාපිතව නීතිගත කරන ලදී. |
| 2025 සැප්තැම්බර් 10 | 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 15(1)(අ) වගන්ති යටතේ තොරතුරු වාර්තා කිරීම සම්බන්ධ 2025 අංක 04 දරන මාර්ගෝපදේශය නිකුත් කරන ලදී. |
| 2025 සැප්තැම්බර් 11 | 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 15(1)(අ) වගන්තිය යටතේ තොරතුරු වාර්තා කිරීම සම්බන්ධ 2025 අංක 05 දරන මාර්ගෝපදේශය නිකුත් කරන ලදී. |
| | 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 15(1)(අ) වගන්තිය යටතේ තොරතුරු වාර්තා කිරීම සම්බන්ධ 2025 අංක 06 දරන මාර්ගෝපදේශය නිකුත් කරන ලදී. |
| | 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 15(1)(අ) වගන්තිය යටතේ තොරතුරු වාර්තා කිරීම සම්බන්ධ 2025 අංක 07 දරන මාර්ගෝපදේශය නිකුත් කරන ලදී. |
| 2025 දෙසැම්බර් 01 | 2025 අංක 17 දරන සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත සම්මත කිරීමත් සමඟ සූදු ක්‍රීඩා සඳහා බලපත්‍ර ලබාදීම සහ අධීක්ෂණය සඳහා පුළුල් බලතල ලබාදෙමින් සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය පිහිටුවන ලදී. |
| 2026 ජනවාරි 20 | අතථ්‍ය වත්කම් නියාමනය කිරීමේ ප්‍රතිපත්තිමය තීරණයට සහය දක්වමින්, අතථ්‍ය වත්කම් සේවා සපයන්නන් සඳහා විචක්ෂණතා නියාමන රාමුවක් සකස් කිරීමට පියවර ගනිමින් පවතී. මෙම වැඩපිළිවෙළ තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ ජාතික සම්බන්ධීකාරක කමිටුවේ ප්‍රතිපත්ති මාර්ගෝපදේශන යටතේ අතථ්‍ය වත්කම් සේවා සපයන්නන් සම්බන්ධ අනුකමිටුවක් පිහිටුවා ඇත. එම අනුකමිටුවේ සමාරම්භක රැස්වීම 2026 ජනවාරි මාසයේදී පවත්වන ලදී. |
| 2026 පෙබරවාරි 19 | 2026 අංක 6 දරන ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පනත ව්‍යවස්ථාපිතව නීතිගත කරගන්නා ලදී. |
| 2026 මාර්තු 11 | ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත (අංක 18/2026) 2026.03.06 දිනැති ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර, 2026.03.11 දින නිකුත් කරන ලදී. |
| 2026 මාර්තු 13 | මුදල් ආයතන (FIs) සහ මුදල් නොවන ව්‍යාපාර හා වෘත්තීන් (DNFBPs) සඳහා මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූල ඝාතන අවි සංගුණනයට මුදල් සැපයීම සඳහා වූ මූල්‍ය අවදානම් ඇගයීම සමඟ සමගාමීව ආයතනික අවදානම් ඇගයීම් සමාලෝචනය සහ යාවත්කාලීන කිරීමේ 2026 අංක 01 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2026 මාර්තු 17 | මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත (අංක 20/2026) 2026.03.13 දිනැති ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර, 2026.03.17 දින නිකුත් කරන ලදී. |
| | මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත (අංක 21/2026) 2026.03.13 දිනැති ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර, 2026.03.17 දින නිකුත් කරන ලදී. |

**රාජ්‍ය ණය කළමනාකරණය**

| | |
|---|---|
| 2025 දෙසැම්බර් 31 | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනු ලැබූ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යයන්, 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතට අනුව ස්ථාපිත කරන ලද රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය වෙත පැවරිණි. 2025 වර්ෂයේ දෙසැම්බර් මාසයේ සිට මෙම කාර්යාලය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වූ අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මෙතෙක් රාජ්‍ය ණය කළමනාකරණය සම්බන්ධයෙන් සිදු කරන ලද සියලුම කාර්යයන්හි සම්පූර්ණ වගකීම රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය වෙත පැවරේ. රාජ්‍ය ණය කළමනාකරණ පනතේ සහ 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ අදාළ විධිවිධානවලට අනුව, 2026 ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි රාජ්‍ය සුරැකුම්පත් සඳහා වූ නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතිය සහ රාජ්‍ය සුරැකුම්පත් සඳහා වූ මධ්‍යම තැන්පතු පද්ධතිය ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව යටතේ අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ඇත. |

3

**මූල්‍ය අංශය**

### බලපත්‍රලාභී බැංකු

| | |
|---|---|
| 2025 මැයි 07 | ඩිජිටල් යටිතල පහසුකම් මත ඉහළ රඳාපැවැත්ම සහ ඒ හා සම්බන්ධ අවදානම්වල ඉහළ යාම මධ්‍යයේ ඇති වූ තොරතුරු තාක්ෂණය හා සයිබර් ආරක්ෂාව හා සම්බන්ධ සිදුවීම්, කඩිනම්ව හා විනිවිදභාවයෙන් යුතුව වාර්තා කිරීමේ අවශ්‍යතාව සහ බැංකු මෙහෙයුම්වල ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම පිණිස 2021 අංක 16 දරන "බලපත්‍රලාභී බැංකු සඳහා තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ නියාමන රාමුව" යන බැංකු පනත් විධානයට අමතරව "බලපත්‍රලාභී බැංකුවල තොරතුරු තාක්ෂණය සහ සයිබර් ආරක්ෂණ සිදුවීම් වාර්තා කිරීම" යන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2025 සැප්තැම්බර් 17 | බලපත්‍රලාභී බැංකුවල ඔරොත්තු දීමේ හැකියාව තහවුරු කිරීමේ අරමුණින් 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ, බලපත්‍රලාභී බැංකු විසින් ප්‍රතිසාධන සැලසුම් සකස් කළ යුතු බව දන්වමින් බැංකු (විශේෂ විධිවිධාන) පනත් නියෝගයන් නිකුත් කරන ලදී. තවද, මේ සම්බන්ධයෙන් පැවති බැංකු පනත් විධාන අවලංගු කරන ලදී. |
| 2025 දෙසැම්බර් 05 | මෑත කාලීන සුළිසුළං සහ ගංවතුර ආපදා තත්ත්වයන් හේතුවෙන් පුද්ගලයන්ට සහ ව්‍යාපාරවලට ඇති වූ අහිතකර බලපෑම් සැලකිල්ලට ගනිමින් බලපෑමට ලක්වූ ණය ගනුදෙනුකරුවන්ට ඵලදායී ලෙස සහන සැලසීමේ අවශ්‍යතාව සලකා බලමින් තම ආදායම හෝ ව්‍යාපාරයට සෘජු බලපෑම් සිදු වූ පුද්ගලයින් සහ ව්‍යාපාර සඳහා සහන සලසන ලෙස සියලුම බලපත්‍රලාභී බැංකුවලින් ඉල්ලා සිටිමින් "මෑත කාලීන සුළිසුළං සහ ගංවතුර හේතුවෙන් ඇතිවූ ආපදා තත්ත්වයෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් හා ව්‍යාපාර සඳහා සහන සැලසීම"යන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2026 මාර්තු 25 | නව ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ ඩිජිටල්කරණය කරන ලද ක්‍රියාවලීන් හා මෙහෙයුම්වල දියුණුව හේතුවෙන් බැංකු අංශයේ හටගත් ප්‍රවණතා සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී බැංකුවල ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සම්බන්ධව බාහිර සේවා ලබා ගැනීම සඳහා වඩාත් ශක්තිමත් සහ විචක්ෂණශීලී රාමුවක් අනුගමනය කිරීම තහවුරු කිරීමේ අරමුණින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. |

### මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම්

| | |
|---|---|
| 2025 ජූනි 23 | මුදල් සමාගම් විසින් තැන්පතු සඳහා පිරිනමනු ලබන සහ ණය උපකරණ සඳහා ගෙවනු ලබන උපරිම පොලී අනුපාතික තීරණය කිරීම සඳහා ක්‍රමවේදයක් සපයා දීම තුළින් තැන්පතු භාර ගැනීම සහ ණය උපකරණ නිකුත් කිරීම සම්බන්ධයෙන් තිරසර ව්‍යාපාර ක්‍රමවේද ප්‍රවර්ධනය උදෙසා තැන්පතු සහ ණය උපකරණ සඳහා වන උපරිම පොලී අනුපාත සම්බන්ධයෙන් විධානය නිකුත් කරන ලදී. |
| 2025 අගෝස්තු 20 | බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්වල ක්‍රියාකාරකම්හි ස්වභාවය, පරිමාව සහ සංකීර්ණත්වය හා සමගාමී වන පරිදි ණය අවදානම් හඳුනාගැනීම, මැනීම, නිරීක්ෂණය සහ පාලනය සඳහා ණය අවදානම් කළමනාකරණ රාමුවක් ස්ථාපනය කිරීමේ අරමුණින් බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සඳහා ණය අවදානම් කළමනාකරණය පිළිබඳ විධානය නිකුත් කරන ලදී. |
| 2025 සැප්තැම්බර් 16 | ඇතිවිය හැකි අවදානම් සහ අනපේක්ෂිත අලාභ අවශෝෂණය කරගැනීම සඳහා මූල්‍ය ස්වාරක්ෂකයක් සැපයීම මගින් ප්‍රාථමික අලෙවිකාර සමාගම් අංශයේ ඔරොත්තුදීමේ හැකියාව ශක්තිමත් කිරීම උදෙසා ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා විධානය නිකුත් කරන ලදී. |
| 2025 නොවැම්බර් 07 | ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ක්‍රමෝපාය, ප්‍රතිපත්ති සහ ක්‍රමවේදයන්, පාලන ව්‍යූහය සැකසීම සහ ද්‍රවශීලතා අවදානම් හඳුනාගැනීම, මැනීම, නිරීක්ෂණය හා වාර්තා කිරීම, පාලනය හා අවම කිරීම සඳහා ඵලදායී ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම මගින් මුදල් සමාගම්වල ශක්තිමත් ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුවක් ස්ථාපිත කිරීමේ අරමුණින්, ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් විධානය නිකුත් කරන ලදී.<br><br>මුදල් ව්‍යාපාර පනත සඳහා යෝජිත සංශෝධන පිළිබඳ පොදු ජනතාවගේ සහ පාර්ශ්වකරුවන්ගේ නිරීක්ෂණ, අදහස් සහ යෝජනා ලබා ගැනීම උදෙසා මහජන අදහස් විමසීම සඳහා යොමු කරන ලදී. |
| 2026 ජනවාරි 09 | මෑත කාලීන සුළිසුළං සහ ගංවතුර ආපදා තත්ත්වයන් හේතුවෙන් පුද්ගලයන්ට සහ ව්‍යාපාරවලට ඇති වූ අහිතකර බලපෑම් සැලකිල්ලට ගනිමින් බලපෑමට ලක්වූ ණය ගනුදෙනුකරුවන්ට ඵලදායී ලෙස සහන සැලසීමේ අවශ්‍යතාව සලකා බලමින් තම ආදායම හෝ ව්‍යාපාරයට සෘජු බලපෑම් සිදු වූ පුද්ගලයින් සහ ව්‍යාපාර සඳහා සහන සලසන ලෙස සියලුම මුදල් සමාගම් වලින් ඉල්ලා සිටිමින් "මෑත කාලීන සුළිසුළං සහ ගංවතුර හේතුවෙන් ඇතිවූ ආපදා තත්ත්වයෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් හා ව්‍යාපාර සඳහා සහන සැලසීම"යන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2026 ජනවාරි 12 | මුදල් සමාගම්වලින් තැන්පතු සහ ණය උපකරණ සඳහා පිරිනමන උපරිම පොලී අනුපාතික සංශෝධනය කිරීමේ විධානය නිකුත් කරන ලදී. |